# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2458/49 - 2025 ඔක්තෝබර් මස 17 වැනි සිකුරාදා - 2025.10.17**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ප්‍රා. ලේ.ගොනු අංකය :* බීඑල්ඩීඑස්/එල්එන්ඩී/1/2/20.
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය: 03J/92/FR/101.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තර:*

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කොට්ඨාස අංක 254බී, අම්පිටියාවත්ත ග්‍රාම නිළධාරී වසමේ මස්සැන්න ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් සකස් කරන ලද කැඩැස්තර සිතියම් අංක 620083 කලාප 12 පත්‍ර අංක 3 හි සඳහන් ඉඩම් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 4.0740 ක් වූ පහත උපලේඛනයේ සඳහන් ඉඩම් කැබැල්ල:

01. කැබලි අංකය 03
ඉඩමේ නම: මස්සැන්නවත්ත; හිමිකම් කියන අය: 1. ආර්.ඒ.ජයසිංහ, 2. ඒ.ඩී. අසංක නිර්මාල්, 3. ඒ.ඩී. නලීන් අසංක;ඉඩම් ප්‍රමාණය: හෙක්. 4.0740.

ඉහත සඳහන් ඉඩමට /පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2025 නොවැම්බර් මස 24 වැනි දින පෙරවරු 10.00 ට බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තවද, 2025 නොවැම්බර් මස 17 වැනි දිනට මත්තෙන්, ඒ ඉඩම/පරවශතාවය සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම /පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

අනුරාධ ජයකොඩි,
ප්‍රාදේශීය ලේකම්(*වැ.බ*),
බලංගොඩ.

2025 ඔක්තෝබර් මස 13 වැනි දින,
බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 10 - 0171

---

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

"උතුරු මැද පළාතේ, පොලොන්නරුව දිස්ත්‍රික්කයේ හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සිංහල පත්තුව සුළු කොට්ඨාසයේ මින්නේරිය ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක පීඕ/එච්කේඩී/2019/127 හා 2019.08.21 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර ඒ

ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්. 00736 ක් පමණ වන පටපිළිකන්ද කැලේ නැමැති ඉඩම් කොටස"

ඉහත නිවේදනය පහත සඳහන් පරිදි සංශෝධනය විය යුතුය.

"උතුරු මැද පළාතේ, පොලොන්නරුව දිස්ත්‍රික්කයේ හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සිංහල පත්තුව සුළු කොට්ඨාසයේ මින්නේරිය ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද 2019.08.21 දිනැති කැඩැස්තර සිතියම් අංක 120134, කලාප අංක 02, පත්‍ර අංක 16 හි කැබලි අංක 193 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්. 0.0736 ක් පමණ වන පටපිළිකන්ද කැලේ නැමැති ඉඩම් කොටස."

**ආර්.අයි.බී. සන්ධ්‍යා පී. රත්නමලල,**
ප්‍රාදේශීය ලේකම් ,
හිඟුරක්ගොඩ.

2025 ඔක්තෝබර් මස 14 වැනි දින,
හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 10 - 0172

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.